# විනය ප්‍රඥප්ති බහුලවීමට බුද්ධ කාලීන ඡබ්බග්ගිය භික්ෂූන්ගේ අශ්‍රාමණික පැවතුම් හේතු වූ ආකාරය පිළිබඳ විමසුමක් (චුල්ලවග්ගපාළි ඛුද්දකවත්ථුක්ඛන්ධකය ඇසුරෙන්)

සුනීතරතන හිමි, කන්දෙගෙදර[1]

## හැඳින්වීම

ඡබ්බග්ගිය භික්ෂූන් වනාහි බුද්ධකාලීන භික්ෂු සමාජයේ ජීවත් වූ අශ්‍රාමණික ගති පැවතුම්වලින් යුත් භික්ෂු පිරිසකි. ඔවුන් අරමුණු කොට පැන වූ විනය ප්‍රඥප්තීන් හතලිස් එකක් පමණ චුල්ලවග්ගපාළි ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි විද්‍යමාන වේ. එබඳු සුවිශාල විනය ප්‍රඥප්තීන් ප්‍රමාණයක් පැනවීම විනය පිටකයෙහි සංවර්ධනය සඳහා ආධාරක වූ බව මගේ නිගමනය යි. චුල්ලවග්ගපාලි ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි විද්‍යමාන වන ප්‍රඥප්තීන් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් පැනවීමෙහි ලා හේතු වූ සවග මහණුන්ගේ අශ්‍රාමණික පැවතුම් හා තත් විනය ශික්ෂාපද පිළිබඳ මෙහි දී විමසුමට ලක් කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

චුල්ලවග්ගපාළියෙහි ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි විද්‍යමාන වන ප්‍රඥප්තීන් ඇසුරින් ඡබ්බග්ගිය භික්ෂූන් නිමිතිකොට බුදුරදුන් විසින් පනවනු ලැබූ විනය ප්‍රඥප්තීන් විමසුමට ලක් කරමින් සූත්‍ර පිටකය හා විනය අට්ඨකථාව ද භාවිත කරමින් පර්යේෂණය සිදුකෙරේ.

## අන්තර්ගතය

මුල් කාලීන බෞද්ධ භික්ෂු සමාජයේ පැවිද්ද ලද බොහෝ දෙනෙක් පැවිදි වීමට පෙරාතුව ඉතා උසස් අන්දමේ ගෘහස්ථ ජීවිත ගතකොට පසුව එහි ආදීනව පිළිබඳ දැන සසර කළකිරී විමුක්තිය සොයා ගොස් පැවිදි බිමට පත් වූ අය වූහ. පැවිද්දේ වටිනාකම පිළිබඳව තේරුම් ගත් ඔවුහු අඩු බලාපොරොත්තු ඇති අපිස් ජීවිතකයකට හුරු වූ පිරිසක් වූහ. කාය චිත්ත විවේකයට තුඩු දෙන පරිසරයකින් හෙබි බෞද්ධ සංඝ සමාජය ඔවුන්ගේ පරමාර්ථ සාධනය සඳහා තෝතැන්නක් විය. සරල මූලික ප්‍රතිපත්ති හතරක් වූ නිස්සය ධර්ම බෞද්ධ භික්ෂු ජීවිතයෙහි පදනම විය. ඕවාද ප්‍රාතිමෝක්ෂයට අනුව ප්‍රකෘති සීලයෙහි ම සංවර වූ පඨමාභිසම්බෝධි

---

[1] පරිවේණාචාර්ය, ශ්‍රී සම්බුද්ධ ජයන්ති දක්ෂිණාරාම පිරිවෙන, හෝකන්දර.

සමයෙහි භික්ෂුවට ශික්ෂා පද පැනවීමක් අවශ්‍ය නොවිනි. කුඩා වුවද වරදෙහි බිය දකිමින් ඔවුහු ආචාර සම්පන්නව විසූහ.

පෙළ දහමෙහි දක්නට ලැබෙන ආකාරයට පඨමාභිසම්බෝධි සමයෙහි භික්ෂුන් වෙත පැවති පිරිපුන්, වඩනා ලද සිත්ගන්නා සුළු පෞරුෂය හා උසස් චරිත සංවර්ධනය විෂයයෙහි ද හේතු වූයේ ප්‍රකෘති සීලය යි. උන්වහන්සේලාගේ සංවරය හුදු බාහිර උපශාන්ත බවක් නොවූ අතර එය ඇතුළු හදින්ම උපන් විනයක් විය. උන්වහන්සේලා අතීතය ගැන සෝක නොකළහ. අනාගතය පිළිබඳ අසීමිත අපේක්ෂා නැත්තෝ වූහ. වර්තමානයෙන් ම යැපුනේ ප්‍රසන්නව ප්‍රබෝධමත්ව විසූහ. සමගිව සතුටු සිතැතිව කයින්, වදනින් මෛත්‍රී සහගත වූහ. මෙය වූ කලී රාග විනය, දෝස විනය, මෝහ විනය වෙත යොමු වූ උසස්ම චරිත සංවර්ධනය යි. අව්‍යාජ වූ ඇතුළු හදින්ම උපන් සංවරය යි. මේ අනුව පැහැදිලි වන්නේ පඨමාභිසම්බෝධි සමයෙහි භික්ෂු සමාජය හික්මවීමට ඕවාද ප්‍රාතිමෝක්ෂය ම පමණක් ප්‍රමාණවත් වූ බව යි.

භික්ෂු ආකල්ප හා පරමාර්ථ විමුක්ති මාර්ගයෙන් පරිබාහිරව ලෞකිකත්වයට නැඹුරු වූ පශ්චාත් කාලීන භික්ෂු සංස්ථාව තුළ ඇති වූ විවිධ අර්බුදකාරී තත්ත්වයන් පෙළ දහම විමසීමෙන් දත හැකි ය. ශික්ෂා පද පැනවීම සඳහා හේතු වූ කරුණු පහක් (ආසවට්ඨානීය ධර්ම) පිළිබඳ මජ්ඣිම නිකාය භද්දාලි සූත්‍රය අනාවරණය කරයි.[2] භික්ෂුවගේ පෞද්ගලික ආයති සංවරය සඳහා හේතු වන ශික්ෂා පද පැනවීමෙහි ලා අපේක්ෂිත අරමුණු දහයක් පිළිබඳ මහාවග්ග පාලියෙහි ද තොරතුරු දක් වේ. එනම් සංඝ සුට්ඨුතාය (සංඝයාගේ හිතසුව පිණිස) සංඝ ඵාසුතාය (සංඝයාගේ පහසු විහරණය පිණිස) දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය (දුස්සීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස) පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය (ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස) දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය (මෙලොව දී පැමිණිය හැකි දුක් දුරුකරනු පිණිස) සම්පරායිකානං ආසවානං පටිඝාතාය (පරලොව දී පැමිණිය හැකි දුක් දුරුකරනු පිණිස) අප්පසන්නානං පසාදාය (නොපැහැදුනුවන්ගේ පැහැදීම පිණිස) පසන්නානං භිය්‍යොභාවාය (පැහැදුනුවන්ගේ පැහැදීම දියුණු කරනු පිණිස) සද්ධම්මට්ඨිතියා (සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස) විනයානුග්ගහාය (විනයට අනුග්‍රහ පිණිස) යනුවෙනි.[3] උක්ත තොරතුරුවලට අනුව පඨමාභිසම්බෝධි සමයෙහි නිරබ්බුධ වූ භික්ෂු සංස්ථාවෙහි ඇති වූ අර්බුදයන් විනය ප්‍රඥප්ති පැනවීමෙහි ලා හේතු වූ බව පෙනේ.

ප්‍රඥප්ති සීලය පිළිබඳ විමසීමේ දී චුල්ලවග්ගපාළියට ලැබෙනුයේ සුවිශේෂී ස්ථානයකි. ඒ අතරින් අපගේ පර්යේෂණ කාර්යය සඳහා අදාළ වනුයේ ඛුද්දකවත්ථුක්ඛන්ධකය යි. පාරාජිකා පාළියෙහි සඳහන් පරමාර්ථ සාධනයෙහි ලා

බුදුන් වහන්සේ විසින් පනවනු ලැබූ ප්‍රඥප්තීන් හා අනුප්‍රඥප්තීන් දෙසියයක් පමණ එහි විද්‍යමාන වේ. ඒ අතරින් ප්‍රඥප්තීන් හතලිස් එකක් ම ඡබ්බග්ගිය භික්ෂූන් අරභයා පනවන ලද ශික්ෂාවන් ය. ඒ අතරින් කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

- මහණෙනි මුතුවැල් ආදී ගෙල පළඳනා ද ඉඟ පළඳනා ද වළලු ද හස්තාභරණ ඇඟිලි මුදු ආදිය ද නොදැරිය යුතු ය. යමෙක් දැරුයේ වී නම් දුකුලා ඇවැත් වේ.
- මහණෙනි රන්මුවා, රිදීමුවා, මිණිමුවා, වෙරළුමිණි මුවා, පළිඟු මුවා, විදුරු මුවා, ඊයම් මුවා, තඹ ලොහොමුවා පාත්‍ර නොදැරිය යුතු ය. යමෙක් දැරුයේ වී නම් ඔහුට දුකුලා ඇවැත් වන්නේ ය.
- මහණෙනි කැටපතෙහි හෝ දිය බඳුනෙහි හෝ මුහුණ සටහන නොබැලිය යුතු. යමෙක් බැලුයේ වී නම් ඔහුට දුකුලා ඇවැත් වන්නේ ය.
- මහණෙනි කොස්සෙන් කෙහෙ නොපීරිය යුතු, පණායෙන් හිස නොපීරිය යුතු, අත් පණායෙන් හිස නොපීරිය යුතු, ඉටි තෙලෙන් හිස කෙහෙ මටසිලිටි නොකළ යුතු, දිය මුසු තෙලෙන් හිසකෙහෙ මටසිලිටි නොකළ යුතු, කළේ වී නම් ඔහුට දුකුලා ඇවැත් වන්නේ ය.

ඛුද්දක වත්ථුක්ඛන්ධකයට අනුව ඡබ්බග්ගිය භික්ෂූන් සුවිශේෂී චරිත ලක්ෂණ වලින් හෙබි පිරිසකි. භික්ෂු ජීවිතයේ පරමාර්ථයන් පසෙක ලා ලෞකික සම්පත්තීන් කෙරෙහි දැඩි නැඹුරුතාවයක් දක්වීම ඔවුන්ගේ චරිතයන්හි සුවිශේෂිතාවය යි. බාහිර අලංකරණය සඳහා දැඩි නැඹුරුතාවයක් දක් වූ ඡබ්බග්ගිය භික්ෂූන් නිරන්තරයෙන් සෙසු භික්ෂූන් අතර කැපීපෙනීමේ උත්සාහයක නිරත වූ බව ද පැහැදිලි ය. ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි සඳහන් ප්‍රඥප්තීන් හා අනුප්‍රඥප්තීන් හතලිස් එකකම ආදි කම්මිකයන් වන මෙම භික්ෂුහු එම ප්‍රඥප්තීන් නැවත උල්ලංඝනය කළ බවට සාධක නොදක්වෙන නමුදු නිතර භික්ෂු සංස්ථාවේ ඇතිකළ අර්බුද පිළිබඳ තොරතුරු එහි දක් වේ. බුද්ධකාලීන භික්ෂු පිරිස් අතරින් මොවුන් සුවිශේෂි වන්නේ සමාන සිතුම් පැතුම් ක්‍රියාකලාපයන් ඇති සදෙනෙක් වූ කණ්ඩායමක් ව භික්ෂු සමාජය තුළ ජීවත් වෙමින් එහි පැවැත්මෙහි ලා ප්‍රබල බලපෑමක් සිදුකිරීම හේතුවෙනි. ලාභයෙන් අගතියට පත් වූ මොවුහු කුල ගෙවල් හා පැවැත් වූ සමීප සබඳතා පිළිබඳ තොරතුරු ද ඛුද්ධකවත්ථුක්ඛන්ධකයේ දක් වේ.

## නිගමනය

නිතරම බාහිර අලංකාරය පිළිබඳ සැලකිලිමත් වූ භික්ෂූන්ගේ ගිහි පවුල් පරිසරය පිළිබඳව ද ඇතිකර ගත හැකි නිගමනයක් නම් ඔවුන් ඉසුරුමත් කුලවලින්

පැවිදි වූවන් විය හැකි බව යි. විමුක්ති සාධන පරමාර්ථයෙහි ලා නොව වෙනත් යම් යම් ලෞකික ලාභ පරමාර්ථයන් උදෙසා මොවුන් පැවිදි වන්නට ඇත. විවිධ නොසරුප් ඇඳුම් පැළඳුම් ආදිය භාවිතය ද පාත්‍ර සිවුරු ආදී එදිනෙදා පරිහරණය කෙරෙන භාණ්ඩ ශ්‍රමණ බවට නොගැළපෙන අයුරින් පරිහරණය කිරීමට උත්සාහ දැරීම ද මොවුන් තුළ පෙනෙන සුවිශේෂි ලක්‍ෂණය කි. මල් ගඳ, විලවුන්, ආදිය දැරීම, නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙහි යෙදීම වැනි මොවුන් විසින් සිදුකරන ලද විවිධ අශ්‍රාමණික ක්‍රියා කලාපයන් ද ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි දක් වේ, ගිහි කාමභෝගීන් මෙන් ජීවිත ගත කළ මෙම පැවිද්දෝ බුදුරජාණන් වහන්සේගේ නිරන්තර අවධානයට පාත්‍ර වූහ. දිගු කාලීන ශාසනික පැවැත්ම විෂයයෙහි ලා මෙවන් පුද්ගලයන් පිළිබඳව අවධානය අත්‍යාවශ්‍ය සාධකයක් විය. රන්, රිදී, මුතු, මැණික් ආදිය පරිහරණය කිරීමෙන් අප්පිච්චතා (අල්පේච්ඡතාවය) සන්තුට්ඨිතා (සන්තුෂ්ඨිය) සුභරතා (පහසුවෙන් පෝෂණය කළ හැකි බව) සල්ලහුකවුත්ති (සැහැල්ලු දිවි පැවැත්ම)[5] ආදී ශ්‍රමණ ගුණාංගයන්ගෙන් තොර වූ මොවුන්ගේ ක්‍රියා කලාපය විනය ප්‍රඥප්තීන් හා අනුප්‍රඥප්තීන් විශාල සංඛ්‍යාවක් පැනවීම සඳහා හේතුවීමත් එය විනයෙහි සංවර්ධනයට උපස්ථම්භක වූ ආකාරයත් බුද්ධකවත්ථුක්ඛන්ධකයෙහි සඳහන් විනය ප්‍රඥප්තීන් ඇසුරෙන් විමසීම මෙම පර්යේෂණයෙහි අරමුණ යි.

**ප්‍රමුඛ පද**: පඨමාභිසම්බෝධිය, ඡබ්බග්ගිය භික්‍ෂූන්, අශ්‍රාමණික පැවතුම්, විනය පැනවීම්

**ආශ්‍රිත ග්‍රන්ථ**

සංයුත්ත නිකාය 01, 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 10 පිටුව.
මජ්ඣිම නිකාය 02, 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 186 පිටුව.
පාරාජිකා පාළි, 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 48 පිටුව.
චුල්ලවග්ග පාළි 02, 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2-127 පිටු
සුත්ත නිපාත, 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 46 පිටුව